 WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

40 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

සංගීතය (පෙරදිග) I, II
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

## සංගීතය (පෙරදිග) II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** අංක (i) සිට (iii) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) නිධ, නිරිග, ප, රිස යනු කුමන රාගයකට අයත් ස්වර සංගතියක් ද?

(ii) සගරිමග, රිමගපම, යනුවෙන් යෙදෙන ස්වර අභ්‍යාසයක ඊළඟ ස්වර ඛණ්ඩය ලියන්න.

(iii) "පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට" පැදි ඛණ්ඩය කුමන කාව්‍ය ග්‍රන්ථයකට අයත් වේ ද?

● අංක (iv) සිට (vi) තෙක් හිස් තැන්වලට සුදුසු ම පිළිතුරු වරහන් තුළින් තෝරා ගෙන ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (සිංහබාහු, මනමේ, කාලගෝල)

| නිර්මාණය | නාට්‍යය |
|---|---|
| ආලෙ බැන්ද මාගෙ රම්‍යවත් | iv ........................................................ |
| වගුරට තරනිඳු දඹදිව පරසිඳු | v ........................................................ |
| දුලා නෙතු පුලා | vi ........................................................ |

● පහත හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි පිළිවෙළින් ලියන්න.

(vii) ලාවනී තාලයේ එක් විභාගයකට අයත් වන මාත්‍රා සංඛ්‍යාව ........................... කි.

(viii) "දෙපානෝ" දේශීය ගීත නාටකය ........................................ සූරීන්ගේ නිෂ්පාදනයකි.

(ix) නාදයේ ත්‍රිවිධ ගුණ, විපුලතාවය, ..................... සහ ................. ලෙස ද හඳුන්වනු ලැබේ.

(x) F Major Chord (කෝඩ්) එක සඳහා ........................ ස්වර තුන යෙදෙන අතර F Minor Chord (කෝඩ්) එක සඳහා යෙදෙනුයේ .................. ස්වර තුන ය.

**2.** පහත දැක්වෙන්නේ නිර්දේශිත රාගධාරී තොරතුරු ඇතුළත් අසම්පූර්ණ වගුවකි.

| | රාගය | මේලය | ආරෝහණ | අනුවාදී | රාග ජාති | මුඛ්‍යාංගය |
|---|---|---|---|---|---|---|
| A | (i) ......... | කල්‍යාණ | (ii) ............ | (iii) ......... | (iv) ...... | ගරිස, ධ, සරිග |
| B | (v) ......... | (vi) ............ | සරිගමපධනිස් | සරිමපනි | සම්පූර්ණ | (vii) ............... |
| C | (viii) ...... | (ix) ...... | (x) ............ | රිගපධනි | (xi) ......... | (xii) ...... |

(i) ඉහත වගුවෙහි හිස්තැන් සඳහා අදාළ පිළිතුරු රෝම ඉලක්කම් සමගින් ලියන්න.

(ii) A හෝ C රාග දෙකෙන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ වාදිතයක හෝ අන්තරා කොටසක් තාල සංකේත සහිත ව ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) B තීරුවට අයත් රාගයට අදාළ ව මාත්‍රා 8කට නොඅඩු තානාලංකාර **දෙකක්** ලියන්න.

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

3. පහත (A) සහ (B) යටතේ දැක්වෙනුයේ නිර්දේශිත **තාල තුනකට** අයත් තොරතුරු දෙකකි.

(A) සමස්ත රේකාව තුළ ම භාවිත වනුයේ ධ, ධිං, ත, තිං යන අවනද්ධාක්ෂර පමණි.

(B) තාලයෙහි විභාගවල යෙදෙන මාත්‍රා සංඛ්‍යාවන් යම් යම් විභාගයන්හි දී අසමාන වේ.

(i) ඉහත තාල තුන අනුව (A) කොටසින් හා (B) කොටසින් පිළිබිඹු වන තාල **දෙක** බැගින් නම් කරන්න.

(ii) (A) කොටසෙහි තාල දෙකෙන් මාත්‍රා සංඛ්‍යාවෙන් වැඩි තාලය සමගුණයෙන් ප්‍රස්තාර කරන්න.

(iii) (B) කොටසෙහි තාල දෙකෙන් මාත්‍රා සංඛ්‍යාවෙන් වැඩි තාලය සම ගුණයෙන් ප්‍රස්තාර කරන්න.

(iv) කෙහෙරවා තාලයෙහි අවනද්ධාක්ෂර ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| දකිනාවෙන් (දායාවෙන්) උපදින අක්ෂර | බායාවෙන් උපදින අක්ෂර | දකිනා සහ බායා කොටස් දෙකින්ම එකවරම උපදින අක්ෂර |
|---|---|---|
| | | |

4. වාර්ෂික විවිධ ප්‍රසංගයේ දී අමිල, අසංග සහ අනුත්තරා විසින් දේශීය රංග සම්ප්‍රදායන් තුනකට අයත් ගීත තුනක් පිළිවෙළින් ඉදිරිපත් කරන ලදී. ඒ පිළිබඳ තොරතුරු කිහිපයක් පහතින් දැක්වේ.

A - අමිල ගැයූ ගීතයට වැයූ තාල වාද්‍ය භාණ්ඩයෙන් 'රත්තං කිට දිත්තං' වශයෙන් වූ තාල පදය වැයුණි.

B - අසංග ගැයූ ගීතයට වැයූ තාල වාද්‍ය භාණ්ඩයෙන් 'ධාධිනා ධාතුනා' වශයෙන් වූ තාල පදය වැයුණි.

C - අනුත්තරා විසින් ගයන ලද්දේ 'වෙදා නටන්නේ සබයෙන් අවසර ගන්නේ' ගීතයයි.

- පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට ඉහත තොරතුරු උපකාර කර ගන්න.

(i) අමිල, අසංග සහ අනුත්තරා ගැයූ ගීත අයත් දේශීය රංග සම්ප්‍රදායන් තුන A , B හා C යටතේ නම් කරන්න.

(ii) A කොටසට අදාළ රංග සම්ප්‍රදායෙහි සංගීතමය ලක්ෂණ **හතරක්** ලියන්න.

(iii) B කොටසට අදාළ රංග සම්ප්‍රදායෙහි සංගීතමය ලක්ෂණ **පහක්** ලියන්න.

5. පහත දැක්වෙනුයේ විවිධ ගී වර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් අක්‍රමවත් වගුවකි.

| | **ගී වර්ගය** | **ගීතය** | **ගායනය හෝ නිර්මාණය** |
|---|---|---|---|
| A | සේ ගී | ශ්‍රී රාහුල හිමිගේ නාමේ | සත් සමුදුර |
| B | ග්‍රැමෆෝන් තැටි ගී | මට මව් පදවිය ලැබුණු දිනේ දී | ගුත්තිල කාව්‍ය |
| C | චිත්‍රපට ගී | රූ රැසේ අඳිනා ලෙසේ | විශාරද නන්දා මාලිනී |
| D | සරල ගී | සිනිඳු සුදුමුදු තලාවේ | එච්.ඩබ්ලිව් රූපසිංහ සූරීන් |

(i) ඉහත වගුවෙහි තොරතුරු එක් එක් ඉංග්‍රීසි අක්ෂරය යටතේ නිවැරදි ලෙස තීරු ගතකර ලියන්න.

(ii) ග්‍රැමෆෝන් ගී පිළිබඳ කරුණු **හතරක්** ඇතුළත් විස්තරයක් ලියන්න.

(iii) චිත්‍රපට සංගීතයෙහි නව මුහුණුවරක් ඇති කළ චිත්‍රපටයකි 'රේඛාව'. එහි සංගීතමය තොරතුරු **හතරක්** සහිත විස්තරයක් ලියන්න.


6. ගැමි ගී හා සේ ගී යනුවෙන් දේශීය ජන ගීය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

(i) ගැමි ගී හා සේ ගී අතර සංසන්දනාත්මක විස්තරයක් කරුණු **හතරක්** ඇතුළත් කරමින් ලියා දක්වන්න.

(ii) ආඝාතාත්මක ගී සහ අනාඝාතාත්මක ගී යනු කවරේ දැයි පැහැදිලි කරන්න. උදාහරණ සඳහා එක් ගී වර්ගයකට එක් ගීය බැගින් යොදා ගන්න.

(iii) සබරගමු වන්නම් හෝ පහතරට සින්දු වන්නම් හෝ පිළිබඳ කරුණු **හතරක්** සහිත ව විස්තරයක් කරන්න.

7. පහත දැක්වෙනුයේ අපරදිග ස්වර ප්‍රස්තාරයකින් උපුටා ගත් කොටසකි.



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

(ii) එම පෙරදිග ස්වර ප්‍රස්තාරය මත එක් එක් විභාගයට අදාළ කෝඩ්ස් (Chords) සලකුණු කරන්න.

(iii) බීතෝවන් හෝ යානි නමැති අපරදිග සංගීතඥයින් දෙදෙනාගෙන් එක් අයකු පිළිබඳ සංගීතමය තොරතුරු **හතරක්** විස්තර කරන්න.

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...